මැතිවරණ කොමිෂන් සභාව
தேர்தல் ஆணைக்குழு
Election Commission
මැතිවරණ මහලේකම් කාර්යාලය, නො.02 සරණ මාවත, රාජගිරිය, ශ්‍රී ලංකාව
தேர்தல்கள் செயலகம், இல 02 சரண மாவத்தை, இராஜகிரிய, இலங்கை
Elections Secretariat, No.02 Sarana Mawatha, Rajagiriya, Sri Lanka

මාධ්‍ය නිවේදනය
ஊடக அறிவித்தல்
MEDIA RELEASE

LAE\2023\43 2023.03.10

2023.03.09 දින පැවැත්වීමට නියමිතව තිබූ පළාත් පාලන ඡන්ද විමසීම, අනපේක්ෂිත හා නොවැළැක්විය හැකි කරුණු මත එකී පළාත් පාලන ආයතන ඡන්ද විමසීම් ආඥා පනතේ (සංශෝධිත) 262 වන අධිකාරය 38 (3) වගන්තිය අනුව මැතිවරණ කොමිෂන් සභාවේ උපදෙස් පරිදි එක් එක් තේරීම්භාර නිලධාරීන් විසින් 2023.04.25 දින එකී ඡන්ද විමසීම පැවැත්වීමට දින නියම කරමින් අංක 2322/28 සිට අංක 2322/52 දක්වා 2023.03.08 දිනැතිව අති විශෙෂ ගැසට් පත්‍ර මඟින් නිවේදනය කරනු ලැබ ඇත.

මෙම ඡන්ද විමසීම පැවැත්වීමට අදාළව SC/FR/69/2023 දරන අධිකරණ ක්‍රියාමාර්ගය අනුව වගඋත්තරකාර පාර්ශ්ව මැතිවරණ කොමිෂන් සභාව වෙත ගෙන්වා යෝජිත දිනට ඡන්ද විමසීම පැවැත්වීමට හැකිවන පරිදි පවත්නා බාධා ඉවත් කිරීම සම්බන්ධව සාකච්ඡා කරන ලදී. එම සාකච්ඡාවේ දී අදාළ රාජ්‍ය ආයතන සමඟ මතු සඳහන් එකඟතා ඇති කරගන්නා ලද බව මෙයින් නිවේදනය කරනු ලැබේ.

- රජයේ මුද්‍රණාලයාධිපතිනිය විසින් තැපැල් ඡන්ද නිකුත් කිරීමට අවශ්‍ය ඡන්ද පත්‍රිකා දින 05ක් ඇතුළත ද අනෙකුත් ඡන්ද පත්‍රිකා දින 20-25ක් අතර ද මුද්‍රණය කොට මැතිවරණ කොමිෂන් සභාව වෙත භාරදිය හැකි බව දන්වා සිටින ලද අතර, ඉහත නඩු තීරණය ද සැලකිල්ලට ගනිමින් මුදල් අමාත්‍යාංශ ලේකම්වරයා මඟින් අවශ්‍ය මුදල් ලබා ගන්නා ලෙසට ද දැනුම් දෙන ලදී.
- ඡන්ද පත්‍රිකා මුද්‍රණය කිරීමේ දී රජයේ මුද්‍රණාලයාධිපතිනිය විසින් කරන ලද ඉල්ලීම අනුව අවශ්‍ය පොලිස් නිලධාරීන් සංඛ්‍යාව හා අවශ්‍ය දින පිළිබඳ තොරතුරු පොලිස්පතිවරයා වෙත යොමු කරන ලෙස හා ඒ අනුව අවශ්‍ය ආරක්ෂාව ලබාදිය හැකි බව ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය පොලිස්පති (මැතිවරණ) විසින් දන්වා සිටින ලදී.
- කොමිෂන් සභාවේ ඉල්ලීම පරිදි ඡන්ද විමසීම සඳහා අවශ්‍ය ඉන්ධන ලබාදීම සම්බන්ධව තීරණය විදුලිබල හා බලශක්ති අමාත්‍යාංශ ජ්‍යෙෂ්ඨ නිලධාරීන් හා ඛනිජ තෙල් සංස්ථා නිලධාරීන් විසින් ඉදිරි දින කිහිපය තුළ දී ලබාදීමට එකඟ විය.

මැතිවරණ කොමිෂන් සභාවේ නියමය පරිදි

**සමන් ශ්‍රී රත්නායක**
මැතිවරණ කොමසාරිස් ජනරාල්